# සමෘද්ධි බැංකු සංගම්හි ණය කටයුතු සම්බන්ධ ක්‍රියාවලිය

# නිවාස ණය නිකුත් කිරීම

**බැංකු මුල්‍ය කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට දහඅටවන එකතුව**

1. සභාපති, පාලක මණ්ඩලය,

   සමෘද්ධි බැංකු සංගමය, ................................

2. කළමනාකරු,

   සමෘද්ධි බැංකු සංගමය, ................................

3. සභාපති, විධායක කමිටුව,

   සමෘද්ධි මහ සංගමය, ................................

4. කළමනාකාර අධ්‍යක්ෂ,

   සමෘද්ධි මහ සංගමය, ................................

5. මුලස්ථාන කළමනාකරු,

   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ................................

6. ප්‍රාදේශිය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,

   ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ................................

7. සමෘද්ධි සහකාර කොමසාරිස්/ දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ................................

8. දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරි,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ................................

9. දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

   දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ................................

10. ප්‍රධාන අභ්‍යන්තර විගණක,

    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

11. සාමාන්‍යාධිකාරී සහ සියළුම අධ්‍යක්ෂවරු,

    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

12. ලේකම්,

    ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,

    5 වන මහල, අංක 464, ටී.බී. ජායා මාවත,

    කොළඹ 10.

13. සහකාර අධ්‍යක්ෂ නීති

    ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය.

**බැංකු මුලා කටයුතු අංශය, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**

**2013.07.25**

දුරකථන අංකය :- 0112 - 873798

ෆැක්ස් අංකය :- 0112 - 869494

2013.07.25

# නිවාස ණය නිකුත් කිරීම

## බැංකු මුලා කටයුතු හා මහ සංගම් අංශය විසින් නිකුත් කරනු ලබන මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට දහඅටවන එකතුව

**01. හැඳින්වීම :-**

සමෘද්ධි බැංකු සංගම් හී නිවාස ණය නිකුත් කිරීම් සම්බන්ධව උපදෙස් මෙහෙයුම් උපදෙස් පත්‍රිකා අංක 4 ට ඊට කරන ලද එකතුන් මගින් ලබා දී ඇත.

1.1 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව ඒ ඒ වර්ෂයන් හී සහනදායී පොලී අනුපාත නිවාස ණය සඳහා ලබාදෙනු ලැබිණි.

**02. 2014 වසරේ දැයට කිරුළ වැඩසටහනට සමගාමීව නිවාස ණය සඳහා වන පොලී අනුපාත හා ණය මුදල පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.**

2.1 ඒ අනුව නිවාස ණය සඳහා වන පොලී අනුපාතය 10% ක් ලෙසට අඩු කෙරේ.

2.2 පොලී අනුපාතය 10% යටතේ ලබාදෙනු ලබන නිවාස ණය සඳහා පොලී ප්‍රතිපූර්ණය කිරීමක් ප්‍රධාන කාර්යාලය මගින් සිදු නොකරන අතර, සෘජුවම බැංකු සංගමය මගින් 10% පොලී අනුපාතයට අදාල ප්‍රතිලාභියාට ණය ලබාදිය හැකිය.

**03. මේ යටතේ ලබාදිය හැකි උපරිම ණය සීමාව.**

3.1. පොලී අනුපාතය 10% යටතේ ලබාදිය හැකි උපරිම ණය මුදල රුපියල් ලක්ෂයකි.(රු.100,000/-)

**04. ණය ලබාදිය හැකි ක්ෂේත්‍රයන් හා ක්‍රමවේදය.**

4.1 මේ යටතේ නිවසක් අළුතින් ඉදිකිරීම හෝ නිවසට කොටසක් එකතු කිරීම හෝ වෙනත් අළුත්වැඩියා කටයුත්තක් සඳහා ණය නිකුත් කළ හැකිය.

4.2 බැංකු සංගම් මගින් දැනට ණය නිකුත් කරනු ලබන ක්‍රමවේදය යටතේ මෙම නිවාස ණය නිකුත් කළ හැකිය.

05. මීට අමතරව දැයට කිරුළ වැඩසටහන් වලට සමගාමීව පහත සඳහන් සහනදායී ක්‍රමයන් යටතේ නිවාස ණය නිකුත් කළ හැකිය.

5.1 එක් බැංකු සංගමකින් රු.50,000/- ක උපරිමයක් යටතේ 0% පොලී අනුපාතය (පොලී රහිත) යටතේ නිවාස ණය මසකට එකක් වන ලෙස ලබාදිය යුතුය.

5.2 අය කරගැනීමේ ක්‍රමවේදය පෙර චක්‍රලේඛ උපදෙස් පරිදි වේ.

5.3 මේ සඳහා තෝරාගත යුත්තේ වඩාත්ම සුදුසු ප්‍රතිලාභීන් දෙදෙනෙකි.

5.4 එමෙන්ම බැංකු සංගමයේ පොදු සුබ සාධක අරමුදල තුලින් එම අරමුදල් ශේෂය ඉක්මවා නොයන පරිදි පහත සඳහන් පරිදි විශේෂ නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය.

- එක් සාමාජිකයකුට ප්‍රදානයක් ලෙස ලබාදිය හැකි උපරිම මුදල රු.10,000/- කි.
- නිවසේ අළුත්වැඩියා කටයුත්තක්, උළු සෙවිලි කිරීමේ දී වහල සකස් කරගැනීම හෝ වෙනත් එකතු කිරීමක් ද හෝ පහසුකම් වැඩිදියුණු කිරීම් වෙනුවෙන් ද මෙම ණය ලබාදිය හැකිය.

5.5 ප්‍රතිලාභී තේරීම.

- ප්‍රතිලාභීන් තේරීම ප්‍රාදේශීය ලේකම්, කළමනාකාර අධ්‍යක්ෂ, මූලස්ථාන කළමනාකරු, ව්‍යාපෘති කළමනාකරු, සමාජ සංවර්ධන සහකාර, කලාප කළමනාකරු, සංවර්ධන නිලධාරී, පාලක මණ්ඩල සභාපති හා ගම්මාන සභාපති යන නිලධාරීන් අතුරින් 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් මගින් සිදුකළ යුතුය.

5.6 රුපියල් ලක්ෂය දක්වා වන ණය උපරිමය දැයට කිරුළ වැඩසටහනට සමගාමීව හඳුන්වාදෙනු ලැබුවද, එම සීමාව හා ණය ක්‍රමය බැංකු සංගම් සඳහා දිගටම බල පැවැත්වේ.

නිවාස ණය නිකුත් කිරීම සම්බන්ධව මෙහෙයුම් උපදෙස් අංක 4 හා ඊට කරන ලද එකතුන් මගින් හඳුන්වා දී ඇති ක්‍රමවේදයන් නොවෙනස්ව පවතින අතර, ණය උපරිමයන් හා පොලී අනුපාතයන් පමණක් මේ තුලින් ඉහත සඳහන් පරිදි සංශෝධනය කරනු ඇත.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

කේ.කේ.එල්. චන්ද්‍රතිලක,
නි. අධ්‍යක්ෂ-බැංකු මූල්‍ය කටයුතු
හා මහ සංගම්.